*සැ. යු.* — 2014.12.05 දින පළ වූ අංක 1,892 දරන ගැසට් පත්‍රයේ IV (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,893 - 2014 දෙසැම්බර් මස 12 වැනි සිකුරාදා - 2014.12.12**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | 2654 |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2015 ජනවාරි මස 02 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2014 දෙසැම්බර් මස 19 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*

2014 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ ජනපද නිලධාරි තනතුරු සඳහා බඳවා ගැනීම - 2014

උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ III ශ්‍රේණිය ජනපද නිලධාරි තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා උතුරු මැද පළාත තුළ පදිංචි සුදුසුකම්ලත් ස්ත්‍රී/පුරුෂ දෙපාර්ශවයෙන්ම අයදුම්පත් කැඳවනු ලැබේ.

1. *පොදු සුදුසුකම් :*

1.1 අයදුම්කරු ශ්‍රී ලාංකික විය යුතු ය.

1.2 අයදුම්කරු උතුරු මැද පළාත් සභා බල ප්‍රදේශය තුළ අයදුම්පත් කැඳවන අවසන් දිනට පූර්වාසන්නයේ නොකඩවා වසර 03ක් ස්ථිරවම පදිංචිව සිටි බව සනාථ කළ යුතු ය.

1.3 අයදුම්පත් කැඳවන අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 30ට නොවැඩි විය යුතු ය. (දැනටමත් උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවයේ නියුතු නිලධාරීන්ට මෙම උපරිම වයස් සීමාව බලපවත්වනු නොලැබේ.)

1.4 මනා ශාරීරික හා මානසික සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතු අතර, මනා චරිතයකින් යුක්ත විය යුතු ය.

2. *අධ්‍යාපන සුදුසුකම් හා තාක්ෂණ සුදුසුකම් :*

සියලු අධ්‍යාපන සුදුසුකම් හා තාක්ෂණික සුදුසුකම් 2015.01.12 දිනට සම්පූර්ණ කර තිබිය යුතු ය.

02.1 *(අ)* කෘෂි විද්‍යාව, ජීව විද්‍යාව, භෞතික විද්‍යාව, සත්ව විද්‍යාව යන විෂයයන්ගෙන් ක්ෂේත්‍රයට අදාළ විෂයයන් දෙකක් සහිතව විද්‍යා විෂයයන් 03කින් අ. පො. ස. (උ. පෙළ) විභාගය එකවර සමත්වීම සහ සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව හෝ සාහිත්‍ය, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට සම්මාන සහිතව විෂයයන් 06කින් අ.පො.ස. (සා.පෙළ) විභාගය එක්වරක දී සමත්වීම.

*සහ*

*(ආ)* ඉහත (අ) හි මූලික අධ්‍යාපන සුදුසුකම් සහිතව පහත සඳහන් වෘත්තීය සුදුසුකම්වලින් එකක් අයදුම්කරුවන් විසින් ලබා තිබිය යුතු ය.

(i) කුණ්ඩසාලේ, අඟුණකොළපැලැස්ස, පැල්වෙහෙර, බිබිල, ලබුදූව, වාරියපොළ, වව්නියාව, අනුරාධපුරය යන කෘෂිකර්ම විද්‍යාලයක කෘෂිකර්මය පිළිබඳ දෑවුරුදු ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම,

*හෝ*

(ii) හාඩි කාර්මික ආයතනයෙන් කෘෂිකර්මය පිළිබඳ ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම,

*හෝ*

(iii) ඇක්වයිනාස් විද්‍යාලයේ කෘෂිකර්ම ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම,

*හෝ*

(iv) රජය විසින් අනුමත ආයතනයක් මගින් පිරිනමනු ලබන දෑවුරුදු කෘෂිකර්ම ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම.

3. *වැටුප් පරිමාණය :*

3.1. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006 (IV) හි MN 3-2006 (A) අනුව උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ ජනපද නිලධාරි III ශ්‍රේණියට හිමි වැටුප් පරිමාණය
රු. 15,005 - 4 x 180 -6 x 240 - 11 x 320 - 20 x 360 - රු. 27,885 (MN 3-2006 (A)

4. *බඳවා ගැනීමේ කොන්දේසි.-* උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කර ඇති බඳවා ගැනීමේ පරිපාටිය අනුව බඳවා ගැනීමේ කොන්දේසි තීරණය වේ.

5. *බඳවා ගැනීමේ ක්‍රමය.-* රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/90 හි විධිවිධාන පරිදි දිස්ත්‍රික් ජනගහන අනුපාතය අනුව ඉහත පවත්නා පුරප්පාඩු සඳහා බඳවා ගනු ලැබේ. මේ සඳහා උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයේ දී ලබා ගන්නා ලකුණු ප්‍රමුඛතාවය මත සුදුසුකම් පරීක්ෂා කර බැලීමේ සම්මුඛ පරීක්ෂණයකින් අනතුරුව සුදුස්සන් තෝරා ගැනේ. සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබා දීමක් සිදු නොවන අතර ලිඛිත විභාගයේ දී එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා 40%ක අවම ලකුණු ප්‍රමාණයක් ලබා නොගන්නා අයදුම්කරුවන් බඳවා ගැනීම සඳහා සලකා බලනු නොලැබේ.

6. *සේවා කොන්දේසි :*

6.1. මෙම තනතුර ස්ථිර ය, විශ්‍රාම වැටුප් සහිත ය.

6.2. පත්වීම රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වීම සම්බන්ධයෙන් නිකුත්කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හි විධිවිධානයන්ට යටත් වේ.

6.3. මෙම තනතුරට පත් කිරීමෙන් අනතුරුව උතුරු මැද පළාත තුළ වසර 05 ක අවම සේවා කාලයක් අනිවාර්යයෙන්ම සේවය කළ යුතු අතර, එම කාලය තුළ දී උතුරු මැද පළාතෙන් පිටතට ස්ථාන මාරු ලබා ගැනීමට හෝ වෙනත් තනතුරකට මුදා හැරීමට කරනු ලබන කිසිදු ඉල්ලීමක් සලකා බලනු නොලැබේ.

7. *අයදුම් කිරීමේ ක්‍රමය :*

7.1. විභාග ගාස්තුව රු.600 කි. මෙම විභාග ගාස්තුව උතුරු මැද පළාතේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවා ලබාගන්නා ලද එන්සී. 100 ලදුපත අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. එකී ලදුපත නොමැතිව එවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරන අතර, ගෙවන ලද විභාග ගාස්තු කිසිම හේතුවක් මත හෝ ආපසු ගෙවනු නොලබන බව ද සැළකිය යුතු ය.

7.2. අයදුම්පත්‍රය මෙහි නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුව නිවැරදිව සම්පූර්ණ කොට 2015.01.12 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ "ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරුමැද පළාත යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් ලද බව දන්වනු නොලැබේ. අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙලවරේ

"උතුරුමැද පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ ජනපද නිලධාරි III ශ්‍රේණියට නිලධාරීන් බඳවා ගැනීම - 2014" යනුවෙන් සහ පදිංචි දිස්ත්‍රික්කය සඳහන් කළ යුතුය. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් හා අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේ දී අස්ථානගත වන අයදුම්පත් සම්බන්ධයෙන් මෙම කොමිෂන් සභාව වග කියනු නොලැබේ.

8. *විභාග මාධ්‍යය.*- විභාගය සිංහල, දෙමළ මාධ්‍යයෙන් පවත්වනු ලැබේ. අයදුම්පත්‍රයේ තමන් විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යයට නියමිත අක්ෂරය පැහැදිලිව සඳහන් කළ යුතු අතර, එය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

9. *විභාග මධ්‍යස්ථානය.*- විභාග මධ්‍යස්ථානය පිළිබඳව උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අයදුම්කරුවන්ට විභාග ප්‍රවේශ පත්‍රය මගින් දැනුම් දෙනු ලැබේ.

10. *විභාග විෂය නිර්දේශය.*- මෙම තනතුරට බඳවා ගැනීම සඳහා අයදුම්කරුවන් පහත සඳහන් විෂයයන් හා විෂය නිර්දේශයන් යටතේ ලිඛිත විභාගයකට යොමු කරනු ලැබේ.

1. *බුද්ධි පරීක්ෂණය :*

කාලය පැය 01 යි. (ලකුණු 100යි) මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාව, විශ්ලේෂණ හැකියාව, කාල කළමනාකරණය විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්න වලින් යුක්ත ය.

2. *තාක්ෂණ ප්‍රශ්න පත්‍රය :*

කාලය පැය 03 යි. (ලකුණු 100) තනතුරට අදාළව තාක්ෂණික දැනුම මැන බැලෙන බහුවරණ හා ව්‍යුහගත මාදිලියේ ප්‍රශ්නවලින් සමන්විත වේ.

(විෂය නිර්දේශය පහත පරිදි වේ.)

I. ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා කෘෂිකර්මාන්තයේ දායකත්වය

(i) ජාතික නිෂ්පාදනයට කෘෂිකර්මාන්තයේ දායකත්වය
(ii) රැකියා නියුක්තිය
(iii) කෘෂිකර්මාන්තයේ අපනයන ආනයන තත්ත්වය

II. ශ්‍රී ලංකාවේ දේශගුණික කලාප පිළිබඳ දැනුම

III. පස සහ ශාක පෝෂණය

(i) පසේ ව්‍යුහය හා වයනය, භෞතික හා රසායනික ලවණතාවය හා භෝග වගාව කෙරෙහි එහි බලපෑම
(ii) ශාක පෝෂණය, පාංශු ශාක පෝෂණ කළමනාකරණය
(iii) පැළෑටි පෝෂණය පිළිබඳ විශේෂ කරුණු

IV. පාංශු රසායනය, පාංශු සංරක්ෂණයේ වැදගත්කම හා විවිධ පාංශු සංරක්ෂණ ක්‍රම

V. වාරිමාර්ග ක්‍රම හා ජල කළමනාකරණය

(i) විවිධ භෝග වර්ග සඳහා උචිත ජල කලමනාකරණය
(ii) ක්ෂුද්‍ර ජල කළමනාකරණ ක්‍රම
(iii) ජල වහනය හා එහි වැදගත්කම

VI. ශ්‍රී ලංකා ජනපද ව්‍යාපාර හා මහවැලි ව්‍යාපාරය පිළිබඳ දැනුම

(i) ජනපද ව්‍යාපාර පිහිටුවා ඇති ස්ථාන
(ii) මහවැලි ව්‍යාපාරයට අයත්වන ප්‍රදේශ

VII. ඉඩම් පරිහරණය සැලසුම් සකස් කිරීම පිළිබඳ දැනුම

VIII. සිතියම් ආශ්‍රිත කරුණු පිළිබඳ දැනුම

(i) අනිලමානය, ඩම්පිලෙවලය, තියෝඩර්ලයිටරය (විකෝමානය)
(ii) 1 : 50,000, 1 : 10,000 අඟලේ සිතියම් හා අවසාන ගම් පිඹුර පිළිබඳ විස්තර

IX. ශ්‍රී ලංකාවේ දැනට පවතින ඉඩම් පිළිබඳ හා ඒ සම්බන්ධ දෙපාර්තමේන්තු, ආයතන පිළිබඳ දැනුම

ඉඩම් වර්ග - රජයේ ඉඩම්
පුද්ගලික ඉඩම්
ප්‍රවේනි ඉඩම්

X. ඉඩම් සංවර්ධන හා බෙදා දීම පිළිබඳ දැනුම

(i) වර්තමානයේ ඉඩම් සංවර්ධනය හා බෙදා දීම සම්බන්ධ ක්‍රියාත්මක ජාතික වැඩ සටහනක් පිළිබඳ අවබෝධය

* ඉඩම් නොමැති පුද්ගලයන් හඳුනා ගැනීම
* බිම් සවිය වැඩ සටහන
* ඉඩම් කැබලි ලක්ෂයේ වැඩ සටහන

XI. රජ සමයේ සිට මේ දක්වා ඉඩම්වල අයිතිය බැහැර කිරීමට යොදාගත් ලේඛන පිළිබඳ අවබෝධය.

i. සන්නස්, නින්දගම්, බදුකර, ස්වර්ණභූමි, රත්නභූමි, රන්බිම

11. *අයදුම්පත් පිරවීම සඳහා උපදෙස්.*- ආදර්ශ අයදුම්පත් ආකෘතියට ප්‍රකාර ඒ 4 ප්‍රමාණයක කඩදාසිය දෙපැත්තම භාවිතා කරමින් එහි පළමු පිටුවෙහි අංක 1-5 දක්වා කරුණු ද, අනෙක් පිටුවල ඉතිරි ඡේද ද ඇතුළත්වන සේ සකස් කර ගත යුතුය. අයදුම්පත්‍රය යතුරු ලියනය කර ගැනීමෙන් හෝ පැහැදිලි අත් අකුරින් සකස් කර ගත යුතුය. අයදුම්පත්‍රය පිරවීමේ දී පහත දැක්වෙන සංකේත අංක නියමිත කොටුවල පැහැදිලිව සඳහන් කළ යුතු ය.

11.1. අයදුම් කරන දිස්ත්‍රික්කය ලෙස සඳහන් කළ යුත්තේ අයදුම්කරුගේ ස්ථිර පදිංචිය ඇති දිස්ත්‍රික්කයට අදාළ සංකේත අංකයයි.

| | | |
|---|---|---|
| අනුරාධපුර | - | 01 |
| පොළොන්නරුව | - | 02 |

අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විදුහලක විදුහල්පති වරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු හෝ ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු හෝ රු 240360/- කට වැඩි වාර්ෂික වැටුපක් ලබන රජයේ/පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිළධාරියකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතු ය.

11.2.1 යම් අයදුම්කරුවෙකුට සුදුසුකම් නොමැති බව පත්වීම ලැබීමට පෙර හෝ පත්වීම් ලබා දීමෙන් පසු හෝ ඕනෑම අවස්ථාවක දී අනාවරණය වුවහොත් අපේක්ෂකත්වය හෝ පත්වීම අවලංගු කෙරෙනු ඇත. එසේම දැන දැනම සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව හෝ නිරවද්‍ය තොරතුරු ඕනෑකමින් යටපත්කර

ඇති බව හෝ අනාවරණය වුවහොත් සේවයෙන් පහ කෙරෙනු ඇත.

11.2.2 රාජ්‍ය සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය.

12. මෙම විභාග පැවැත්වීම පිළිබඳව හෝ පැවැත්වීමෙන් පසුව තෝරා ගැනීම් කිරීම/නොකිරීම හෝ පුරප්පාඩු සංඛ්‍යාව පිළිබඳව අවසාන තීරණය උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය. එසේම මෙම නිවේදනයේ විධිවිධාන සලසා ඇති කිසියම් කරුණක් වෙතොත් ඒ පිළිබඳ පැහැදිලි කිරීම/තීරණය කිරීම උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

ආර්.එම්. වන්නිනායක,
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු මැද පළාත.

2014 නොවැම්බර් මස 18 වැනි දින,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු මැද පළාත.

ආදර්ශ අයදුම්පත්‍රය

**උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ ජනපද නිලධාරි තනතුරු සඳහා බඳවා ගැනීම - 2014**

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය : ☐ (සිංහල - S, දෙමළ - T, ඉංග්‍රීසි - E)
(අදාළ සංකේතය කොටුව තුළ ලියන්න)

විභාග අංකය : ☐
(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

1. පදිංචි දිස්ත්‍රික්කය : ☐ දිස්ත්‍රික්කයට අදාළ සංකේත අංකය : ☐

1.1. මුල් අකුරු සමග නම :........................................................................
(Mr/Mrs/Miss) (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.2. මුල් අකුරු සමඟ නම මයා/මිය/මෙනවිය (සිංහලෙන්/දෙමළෙන්) :........................................ මයා/මිය/මෙනවිය

1.3. මුල් අකුරුවලින් හැඳින්වෙන නම් (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :........................................

1.4. මුල් අකුරුවලින් හැඳින්වෙන නම් (සිංහලෙන්/දෙමළෙන්) :........................................

2. 2.1 ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :........................................

2.2 ප්‍රවේශපත්‍ර එවිය යුතු ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :........................................

2.3 ප්‍රවේශපත්‍ර එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :........................................

2.4 දැනට රාජ්‍ය සේවයේ නියුතු අයෙකු නම් කාර්යාලයීය ලිපිනය :........................................

2.5 දුරකථන අංකය :........................................

3. 3.1 උපන් දිනය :........................................

3.2 අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට (2015.01.12) වයස : අවු. :.................. මාස :.................. දින :..................

3.3 ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

4. ස්ත්‍රී/පුරුෂ භාවය :........................................

5. ස්ථිර පදිංචිය පිළිබඳ විස්තර.-

5.1 අයදුම්කරු ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :........................................

| *ඡන්ද හිමි නාම ලේඛනයට අනුව පදිංචිය* | *2012* | *2013* | *2014* |
|---|---|---|---|
| මැතිවරණ කොට්ඨාසය | | | පෙර වර්ෂයේ ලියාපදිංචි ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ 2014 වර්ෂය සඳහා ද ලියාපදිංචියට අයදුම්කර තිබේ ද?<br><br>ඔව්/නැත* |
| ඡන්ද ප්‍රදේශය | | | |
| ඡන්ද කොට්ඨාසය | | | |
| ග්‍රාම නිලධාරි කොට්ඨාස අංකය | | | |
| ගෘහ අංකය | | | |
| නමට ඉදිරියෙන් ඇති පිළිවෙල අංකය | | | |

6. *අධ්‍යාපන සුදුසුකම් :*

6.1. අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය : (සහතිකවල ඡායා පිටපත් අමුණන්න.)

වර්ෂය :.................................... විභාග අංකය :..............................

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

6.2 අ.පො.ස. (උසස් පෙළ) විභාගය : (සහතිකවල ඡායා පිටපත් අමුණන්න.)

වර්ෂය :.................................... විභාග අංකය :..............................

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |
| | |

7. *තාක්ෂණ සුදුසුකම් :* (සහතිකවල ඡායා පිටපත් අමුණන්න.)

| *ආයතනය* | *හදාරා ඇති පාඨමාලාව* | *කාල සීමාව* | *සාමාර්ථය* | *සහතිකයේ අංකය හා දිනය* |
|---|---|---|---|---|
| | | | | |

8. *වෙනත් සුදුසුකම්* : ..........................................................................................................................

9. විභාග ගාස්තු ගෙවීම පිළිබඳ තොරතුරු.-

(i) විභාග ගාස්තු ගෙවූ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නම :..........................................................................
(ii) දිනය :..........................................................................
(iii) කුවිතාන්සි අංකය :..........................................................................

| |
|---|
| (මුදල් ගෙවා ලබාගත් ලදුපත මෙම තීරුව අසලින් අලවන්න) |

***අයදුම්කරුගේ ප්‍රකාශය***

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි. මෙහි සඳහන් කරුණු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව අනාවරණය වුවහොත් මා සේවයට බඳවා ගැනීමට නුසුදුස්සකු වන බවත් පත්වීමක් ලැබීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් සේවයෙන් පහකිරීමට යටත් වන බවත් මා දනිමි.

............................................ ....................................................
දිනය අයදුම්කරුගේ අත්සන.

***අයදුම්කරුගේ අත්සන සහතික කිරීම***

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ..........................................................................මහතා/මහත්මිය/මෙනවිය මම පෞද්ගලිකව හඳුනන බවත්, ඔහු/ඇය අද දින මා ඉදිරිපිට දී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත්, සහතික කරමි.

.......................................... ..................................................................
දිනය සහතික කරන්නාගේ අත්සන.

සහතික කරන්නාගේ සම්පූර්ණ නම :..........................................................................
තනතුර :..........................................................................
ලිපිනය :..........................................................................

10. රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවාවන්හි දැනට සේවයෙහි නියුතු අයදුම්කරුවෙකු නම් පහත සඳහන් සහතිකය දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් කළ යුතු ය.

මෙම ඉල්ලුම්කරු වන..........................................................මහතා/මහත්මිය/මෙනවිය මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ.......................................................... වශයෙන් සේවය කරයි. පසුගිය වසර 05 තුළ ඔහු/ඇය මොනම ආකාරයක හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව සහ ඉහත තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා මුදා හැරිය හැකි බවත් සහතික කරමි.

............................................ ....................................................................
දිනය දෙපාර්තමේන්තු/ආයතන
ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව සහිතව)

12-268

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.